විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
මාලිගාවත්ත ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 · மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10 · Maligawatte Secretariat, Maligawatte, Colombo 10

අංකය / இல. / No. විවැ/ චක්‍රලේඛ/2008 දිනය / திகதி / Date 2008- 09- 14

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 7/ 2008

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

**<u>ප්‍රයෝජනයට නොගත් නිවාඩු උපයෝගී කොට ගෙන</u>**
**<u>වයස අවුරුදු 61 දක්වා සේවයේ යෙදී සිටීම</u>**

2007- 11- 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/ 2007 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ වෛද්‍ය සහතිකයක් මගින් තහවුරු කිරීමට යටත්ව වයස අවුරුදු 60 න් විශ්‍රාම ගන්නා රාජ්‍ය සේවකයන්ට ඔවුන් විසින් ඉතිරි කරනු ලැබූ අනියම් සහ විවේක/ අසනීප නිවාඩු ප්‍රයෝජනයට ගනිමින් අවුරු 61 දක්වා නැවත සේවයේ යෙදීමට අවස්ථාවක් උක්ත චක්‍රලේකය මඟින් ලබා දී ඇත.

03. වයස අවුරුදු 60 සම්පූර්ණවීමෙන් විශ්‍රාම ලැබීමේදී මතුවී ඇති ගැටළු සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු බව දන්වමි.

1. අනිවාර්යයෙන්ම විශ්‍රාම ගැන්වීමේ දිනය එනම් වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනයේදී නිලධාරියා විශ්‍රාම ගැන්විය යුතුය.
2. එදිනට විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීමේ හිමිකම් ඇත.
3. වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දිනයේ සිට මාසික විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ හැකියාව ඇත.
4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/ 2007 යටතේ නැවත සේවයේ යෙදවීමත් ඒ සඳහා වැටුප ලබා ගැනීමත් යන කරුණු විශ්‍රාම වැටුප අවුරා තැබීම සඳහා අදාල නොවිය යුතුය.

කේ. ඩී. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්



| | Telephone | Fax |
|---|---|---|
| Director General | 2431647 | 2342078 |
| Director | 2432008 | 2342078 |
| Director (F) | 2434974 | 2391403 |
| Internal Auditor | 2329634 | 2329634 |

| | Telephone | Fax |
|---|---|---|
| W&OP | 2332346 | 2432214 |
| PSPF | 2324375 | 2332347 |
| L.G.U. | 2342525 | 2342525 |
| Registration | 2329178 | - |

| | Telephone |
|---|---|
| Policy | 2329580 |
| Forces | 2320439 |
| Computation | 2434414 |
| Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk